**ශීර්ෂය 108 - තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්ය සාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1) (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂ 108 - තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරන විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙණුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු වී තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ ගිණුම්කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් එම විධිවිධානවලට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127(1)(අ) | නිවැරදිව සහ මුල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.7(ආ) |
| | | 2. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.9(ආ) |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.10 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.5 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.11 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.3(අ) |
| | | 2. වත්කම් ඌන උපයෝජනය | 2.3(ආ) |
| | | 3. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම | 2.3(ඇ) |
| | | 4. භාණ්ඩ සමීක්ෂණ වාර්තා | 2.3(ඇ) |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | අග්‍රිම ගිණුමේ අඩුපාඩු | 2.9(ආ) )(ii) |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.7.(ඇ)(i) |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.7.(ඇ)(ii) |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | පාඩු හා හානි | 2.4 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණු අතර ක්‍රියාත්මක කිරීමේදී පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු රු. මිලියන 146.45 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර තිබුණ අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රාග්ධන වැය සඳහා රු. මිලියන 11.2 ක වැඩ සැලසුම් කර තිබුණද ඒ සඳහා රු. මිලියන 160.19 ක් වැය කර තිබුණි.මෙහිදී ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල රු. මිලියන 8.9 කට අදාල වැඩසටහන් 06 ක ප්‍රගතිය කාර්යසාධන වාර්ථාවේ ඇතුළත් කර නොතිබුණි.

## 2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යභාරයන් 17 යටතේ වැඩසටහන් 02 ක් සඳහා රු. මිලියන 206.95 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණත් එම කාර්යයන්වල කාර්යසාධක දර්ශකය සඳහන් කර නොතිබුණු නිසා කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටුකර තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 2.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) වාහන උපයෝජනය

අමාත්‍යාංශය සතුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 30 ක් පැවති අතර ඉන්ධන සහ නඩත්තු වැය සඳහා පිළිවෙලින් රු. 9,219,869 ක් සහ රු. 8,888,426 ක් වශයෙන් මුළු වියදම රු. 18,108,295 වැය කර තිබුණි. 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 යේ 3.3 ඡේදය ප්‍රකාරව වාර්ථා සකස් නොකිරීම නිසා ධාවන කළ දුර පිළිබඳව හා කිලෝමීටර් 01 ක් සඳහා වැය කරන ලද වියදම කොපමණද යන්න තහවුරු කරගත නොහැකි විය.

### (ආ) ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශයේ සංචිතය යටතේ පැවති වාහන ප්‍රමාණය 15 ක් වුවද සංචිතය රාජකාරී සඳහා යොදා තිබුණු රියදුරු සංඛ්‍යාව 4 ක් විය. මෙහිදී සංචිතය සතු වාහන ඌන උපයෝජිතව පැවතිණි. ඇමතිවරයා, ලේකම්වරයා හා නිලධාරීන් සඳහා මිලදී ගත් රථ පරණ වීම, ඉන්ධන දහනය අධික වීම වැනි හේතුන් මත අත්හැර දැමීම හා නියෝජ්‍ය ඇමතිගේ හා එම කාර්යමණ්ඩලයේ තනතුරු අහෝසි වීම යන කරුණු සංචිත රථ ගණන වැඩිවීමට හේතු වී තිබුණි.

(ඇ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**-----------------------------------------------------------------**

මුදල් අමාත්‍යාංශයට අයත් ජීප් රථයක් 2014 වර්ෂයේදී තැපැල් අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණු අතර 2014 පෙබරවාරි 09 දින අනතුරකට ලක්වීමෙන් පසු එදින සිට මේ දක්වාම වසර 04 කට අධික කාලයක් භාවිතයෙන් තොරව ගල්කිස්ස උසාවියේ ගාල්කර තිබුණි.

(ඈ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

**-------------------------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර ඇතත් 2018 අගෝස්තු වන විට අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි.

**2.4 පාඩු හා හානි**

**-------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 104(3) අනුව අලාභ හානියක් සිදු වූ විට පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 7 කට වැඩි කාලයක් ගත කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම ඉදිරිපත් කළ යුතු බවට සඳහන් කර ඇතත් අවස්ථා 10 ක අනතුරු සඳහා ප්‍රාරම්භක වාර්තාව දින 14 සිට මාස 08 දක්වා කාලයක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(4) අනුව පරීක්ෂණයෙන් පසුව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන්මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් වාහන අනතුරු සම්බන්ධයෙන් මාස 02 සිට මාස 29 දක්වා ප්‍රමාද වී වාර්තා ඉදිරිපත් කළ තිබූ අවස්ථා 10 ක් විය. මෙම ප්‍රමාදයන් සඳහා අනතුර සිදු වූ වහාම අනතුර දැණුම් නොදීම හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) අනතුරට බාහිර පාර්ශවයන් වගකිව යුතු වන විට ඔහුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග නොගෙන රක්ෂණයෙන් මුදල් ලැබීමෙන් පසු ඉතිරියක් වේ නම් මුදල් රෙගුලාසි 109 මගින් කපාහැරීමට කටයුතු කර තිබුණි. මෙසේ බාහිර පාර්ශවයන් වගකිය යුතු වන අවස්ථා 06 කදී රු. 499,037 ක මුදලක් අමාත්‍යාංශ වාහනයේ රක්ෂණයෙන් ලබාගෙන රු. 73,547 ක මුදලක් කපාහැර තිබුණි.

**2.5 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

**2.5.1 තැපැල් කාර්යාල ජාලයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම**

**---------------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) තැපැල් කාර්යාල ජාලගත කිරීම මගින් 2010 වර්ෂයේ සිට විවිධ අංශයන් යටතේ මහජන සේවා ලබා දී තිබුණ අතර 2018 වර්ෂයේ පෙබරවාරි වන විට එම සේවා වර්ග ප්‍රමාණය 25 දක්වා වර්ධනය වී තිබුණි. මහජනතාවට සේවා සැපයීමේදී ජාලය තුළ පහත අඩුපාඩු පවතින බවට තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් කාර්යාල සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(i) සේවා පද්ධතියට ඇතුළු වීම සඳහා වෙබ් අංක 10 ක් හදුන්වා දී තිබුණද 2018 ජූලි 10 දින වන විට මෙම අංක අතරින් අංක 03 ක් පමණක් භාවිතා කළ හැකිව තිබුණි. මෘදුකාංග

වල සිදු වූ මන්දගාමී තත්ත්වය පිළිබඳ CERT ආයතනයේ උපදෙස් අනුව වෙබ් ලිපින 03 ක් පමණක් භාවිතා කිරීමට කටයුතු කළ බවට වාර්තා කර තිබුණි.

(ii) පද්ධතියට ඇතුළත් වීම සඳහා නම සහ මුර පදය ඇතුළත් කළ පසු ඊලග පියවරට පැමිණීමට හා පාරිභෝගිකයින්ට සේවා සැපයීමට අසාමාන්‍ය කාල ප්‍රමාදයන් සිදු වන බව නිරීක්ෂණය විය. එසේම ප.ව 3 ට ආසන්න කාලයේදී පද්ධතියේ කාල ප්‍රමාදය වැඩියෙන් පවතින අතර බිල්පත් ගෙවීමට එන පාරිභෝගිකයන්ට වේගවත් සේවාවක් සැපයීමට නොහැකි වී තිබුණි.

(iii) විශාල මුදල් ප්‍රමාණයක් වැයකර මහජනතාවට වඩා වේගවත් සේවාවක් ලබා දීමේ අරමුණින් පද්ධතිය නිර්මාණය කළද පද්ධතිය මගින් සේවා ලබාදීමේදී ජනතාව අපේක්ෂා කරන වේගවත් සේවාව ඉටුකර දීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වුවද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පසු විපරමක් හා අධීක්ෂණයක් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(iv) 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සහ 2018 පළමු මාස 06 තුළ ජාල පද්ධතිය භාවිතා කර රැස්කරනු ලබන සියළුම ආදායම් ක්ෂේත්‍රයන්ගේ මුළු ආදයම සහ ගණුදෙනු සංඛ්‍යාව පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියද දැනට පවත්වාගෙන යන සේවා 25 ක් අතුරින් සේවා 17 කින් පමණ රැස්කරන ලද ආදායම් විස්තර විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ජාල පද්ධතිය හරහා වාර්තා ලබාගැනීම දුෂ්කර වී ඇති බව නිරීක්ෂණය විය.

(v) 2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රැස්කරණ ලද කොමිස් ආදයමේ ශේෂය 2017 වර්ෂයේ ආදායම් ගිණුමේ දක්වන ලද ශේෂයන් සමඟ සැසඳීමේදී පිළිවෙලින් විදුලි බිල්පත්, ජල බිල්පත් හා ඊ-චැනලින් සේවය අතර රු. 15,839,546 ක් රු. 717,616 ක් හා රු. 2,395 ක් වශයෙන් වෙනසක් පැවතුණි. ඒ අනුව පද්ධතිය හරහා නිවැරදි තොරතුරු ලබාගැනීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය.

**2.5.2** වාහන අපහරණය කිරීම

----------------------------

සමාලෝචිත වර්ෂය තුළදී අපහරණය කරන ලද වාහනවල වටිනාකම ගිණුමෙන් ඉවත් කිරීමේදී එහි පිරිවැය ඉවත් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් අපහරණය කරන ලද වාහන 06 ක විකුණුම් වටිනාකම වූ රු. 10,553,298 ක් ගිණුමෙන් ඉවත් කර තිබුණි.

**2.5.3** වාහන අනතුරු

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම්ට අනුයුක්ත කර තිබූ මෝටර් රථයක් 2015 වර්ෂයේදී අවස්ථා දෙකකදී අනතුරුවලට ලක්වී තිබුණද 2017 වර්ෂය දක්වාම අළුත්වැඩියාවන් සිදු කර නොතිබුණි.

(ආ) මෙම රථය 2017 නොවැම්බර් 13 දින නැවත අනතුරට ලක්වී තිබුණද අනතුර සඳහා මුදල් රෙගුලාසි 104(3) වාර්තාව ඉදිරිපත් කර තිබුණේ මාස දෙකක ප්‍රමාදයෙන් පසු 2018 ජනවාරි 20 දින දීය. මුදල් රෙගුලාසි 104(4) වර්තාව 2018 ජූලි 18 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

## 2.6 තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීම

---

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍ර ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයන් විසින්ම කටයුතු කළයුතුව පැවතියද තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් තැපැල් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් අරමුණු 04 ක් සම්බන්ධයෙන් තොරතුරු යොමුකර තිබුණි. එසේ වුවද තැපැල් දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්යන්ට සම්බන්ධව තිරසර අරමුණු ඉලක්ක හා එම අරමුණු කරා ලඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක කරා ලඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද නිසි පරිදි හඳුනාගත යුතු වුවත් තිරසර අරමුණු 17 ම තැපැල් දෙපාර්තමේන්තුවේ තිරසර අරමුණු ලෙස හඳුනාගත් බවට දක්වා තිබුණ බැවින් තැපැල් දෙපාර්තමේන්තුවට සම්බන්ධ අරමුණු මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ආ) කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් සැපයීම අත්‍යවශ්‍ය වුවත් දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ලඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ ඇති තවත් දෙපාර්තමේන්තුවක් වන මුස්ලිම් ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 2.7 කාර්යභාර්යන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජන කිරීම

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරි පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 88.93 | 84.34 | 4.59 | 5.2 |
| | මූලධන | 175.05 | 133.60 | 41.45 | 23.7 |
| | **එකතුව** | **263.98** | **217.94** | **46.04** | **17.4** |
| 2014 | පුනරාවර්තන | 112.70 | 103.82 | 8.88 | 7.9 |
| | මූලධන | 246.30 | 204.09 | 42.21 | 17.1 |
| | **එකතුව** | **359** | **307.91** | **51.09** | **14.2** |
| 2015 | පුනරාවර්තන | 101.70 | 98.64 | 3.06 | 3.0 |
| | මූලධන | 29.20 | 29.09 | 0.11 | 0.4 |
| | **එකතුව** | **130.90** | **127.73** | **3.17** | **2.4** |
| 2016 | පුනරාවර්තන | 128.43 | 122.64 | 5.79 | 4.5 |
| | මූලධන | 415.30 | 257.52 | 157.78 | 38.0 |
| | **එකතුව** | **543.73** | **380.16** | **163.57** | **30.0** |
| 2017 | පුනරාවර්තන | 122.40 | 116.72 | 5.68 | 4.6 |

| | | | | |
|---|---|---|---|---|
| මූලධන | 176.17 | 160.19 | 15.98 | 9.0 |
| **එකතුව** | **298.57** | **276.91** | **21.66** | **7.3** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**

**------------------------------------------**

අමාත්‍යාංශයට අදාල කාර්යභාර්යන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුව තාත්ත්වික ලෙස පිළියෙල කර නොතිබීම නිසා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් ලබාගත් මුදලින් ද රු.මිලියන 15.41 ක් ඉතිරි කර තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(I) සලසා තිබුණු ප්‍රතිපාදනයම උපයෝජනය නොකිරීම**

**-----------------------------------------------------**

108-1-1-2002 දරන පිරියත හා යන්ත්‍රෝපකරණ වැය විෂයට අදාල ඇස්තමේන්තු මුදල වූ රු. 200,000 සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

**(II) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

**------------------------------**

වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු. මිලියන 59.80 ක ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන වලින් එකතුව රු. මිලියන 43.62 පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 44 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**---------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**--------------------------------------------**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 108011/108012 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම්** | | **ලැබීම** | | **හර ශේෂ** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 6.00 | 4.50 | 2.00 | 2.80 | 26.00 | 12.50 |

ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 3. 7 ඡේදය ප්‍රකාරව කිසියම් ණයක් ලබාදුන් පසු එළඹෙන ඊළඟ මාසයේ සිට ණය වාරික අයකළ යුතු වුවද එපරිදි අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.9** **අග්‍රිම ගිණුම**

**-------------**

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් 01 ක 2017 දෙසැම්බර් 31 දින වන විට ශේෂ එකතුව රු. 374,490 ක් විය. අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු අග්‍රිම ගිණුම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දින වන විට මාස 21 කට ඉහතදී නිලධාරියෙකුට නිකුත් කර තිබුණු රු. 350,000 අග්‍රිමයක් 2018 මැයි වන විටද නිරවුල් කර නොතිබුණි.අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සමුළුවක් පැවැත්වීම සඳහා බන්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව වෙත ගෙවා තිබූ මෙම රු. 350,000 ක මුදල එම උත්සවය නොපැවැත්වීම නිසා ආපසු ගෙවන ලෙස එම ආයතනයට දන්වා යවා තිබූ නමුත්, එම මුදල ප්‍රතිපූර්ණය කළ නොහැකි බවත් ඒ සඳහා වෙනත් සේවාවක් ලබා දීමට හැකි බවත් බන්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ පාලන අධිකාරීය විසින් දන්වා එවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසිකව ලබා ගැනිමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසික ඉල්ලුම් කළ අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| **මාසය** | **සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය** | **ඉල්ලුම් කළ අග්‍රිමය** | **ලැබී තිබුණු අග්‍රිමය** | **සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස** | **ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස** |
|---|---|---|---|---|---|
| ------ | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ජනවාරි | 11.79 | 11.79 | 11.56 | 0 | 0.23 |
| පෙබරවාරි | 11 | 14.28 | 13.22 | (3.28) | 1.06 |
| මාර්තු | 11.1 | 11.48 | 9.98 | (0.38) | 1.5 |
| අප්‍රේල් | 12.86 | 54.63 | 22.22 | (41.77) | 32.41 |
| මැයි | 12.17 | 33. 27 | 76.37 | (21.1) | (43.1) |
| ජුනි | 12.17 | 12.47 | 10.21 | (0.3) | 2.26 |
| ජූලි | 12.61 | 22.71 | 12.93 | (10.1) | 9.78 |
| අගෝස්තු | 12.61 | 55.21 | 32.48 | (42.6) | 22.73 |
| සැප්තැම්බර් | 12.65 | 12.76 | 9.42 | (0.11) | 3.34 |
| ඔක්තෝබර් | 12.61 | 12.63 | 13.61 | (0.02) | (0.98) |
| නොවැම්බර් | 12.62 | 12.63 | 13.09 | (0.01) | (0.46) |

| | | | | | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් | 12.62 | 57.77 | 26.72 | (45.15) | 31.05 |
| එකතුව | 146.81 | 311.63 | 251.81 | (164.82) | 59.82 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සැලසුම් කළ ප්‍රමාණයට වඩා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 164.82 ක අග්‍රිමයක් ඉල්ලුම්කර තිබුණ අතර අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම මේ සඳහා හේතු වී තිබුණි.

(ii) ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් රු.මිලියන 59.82 ක් ලැබී නොතිබුණු අතර එයින් රු. මිලියන 31.05 ක්ම 2017 දෙසැම්බර් මාසය සඳහා විය.

## 2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් ලේඛන විධිමත්ව යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක, පරිගණක උපාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඇ) | අලාභ හානි ලේඛනය | මු.රෙ. 110 | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඈ) | වැය ලෙජරය | මු.රෙ. 447 | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඉ) | ඇප තැන්පත් ලේඛනය | මු.රෙ. 891(1) | පවත්වා නොතිබුණි. |

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### 2.11.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්යභාර්ය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩ වෙනුවෙන් රු. 23,555,574 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු 258,852 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ------------------- | ---------- | ------------- | ---------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 13 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්වීතියික මට්ටම | 61 | 47 | 14 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 30 | 25 | 05 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 05 | 04 | 01 |
| | | ---- | ---- | ---- |
| | එකතුව | 115 | 91 | 24 |

පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් වුවද එම සංඛ්‍යාව බඳවාගෙන නොතිබුණි.

## 2.12 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාල වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තැබිය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.